بسم الله الرحمن الرحيم

الحمد لله وحده وصلاة الله وسلامه على من لا نبي بعده أما بعد :

## مَدْخَلٌ

## فِيْ التَّعْرِيْفِ بِعِلْمِ الْفِقْهِ وَمَصَادِرِهِ وَبَعْضِ مُصْطَلَحَاتِهِ

මෙය **ඉල්මුල් ෆික්හ්** යන්නෙහි මූලික හැඳින්වීමක්ද, එහි මූලාශ්‍රයන් සහ එය පැහැදිලි කිරීමේදී භාවිතා වන යෙදුම්වල විග්‍රහයන්ද ඇතුළු කෙටි පැහැදිලි කිරීමක්ද වේ.

**අල් ෆික්හ් යනු කුමක්ද?**

අල් ෆික්හ් යන්නෙහි අරුත් දෙකක් ගැබ්වී ඇත.

1. පළමුව එම අරාබි වචනයෙහි සාමාන්‍ය අරුථ වේ.
2. දෙවනුව ෆික්හ් විශාරදයන් අදහස් කරන අරුථ වේ.

අරාබි බසින් ෆික්හ් යන් වචනයට 'වටහා ගැනීම' හෙවත් 'තේරුම් ගැනීම' යනුවෙන් අරුත් දැක්විය හැක.

ශුද්ධ කුර්ආනයේ අල්ලාහ් මෙසේ පවසයි

((وَلَكِنْ لاَ تَفْقَهُوْنَ تَسْبِيْحَهُمْ))

*'එනමුදු ඔවුන් අප සිහි කිරීම ඔබලා වටහා නොගන්නහුය'*

පොදු භාවිතයේදී අල් ෆික්හ් යන්න අවශ්ථා දෙකකදී යෙදේ.

**පළමුව,**

- අල් මුකල්ලෆ් හා සම්බන්ධ ප්‍රකාශ සහ ක්‍රියාවන් පිළිබඳව පැහැදිලි හා පිළිගත් සත්‍ය දැනුම් දීම් මත වූ ෂරීයත් නීතීන් වටහා ගැනීමට යොදනු ලැබේ.

- පිළිගත් සථ්‍ය දැනුම් දීම් යනු ශුද්ධ කුර්ආනයේ හා අස්සුන්නාහි හෝ ඒ මූලයන් දෙකෙහිම නිර්දේශ මත වන 'ඉජ්මා' 'ඉජ්තිහාද්' යනාදිය වේ.

- මෙයට නිදසුනක් ලෙස වුළු නම් අඩ් දේවනය සඳහා නියියත් නම් වූ අදිටන අනිවාර්‍ය වන බව අඟවන පහත සඳහන් හදීස් පදනම ගෙන දැක්විය හැක.

قَالَ النَّبِيِّ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ اِنَّمَا الْاَعْمَالُ بِالنِّيَّاتِ ( رواه البخاري : ١ ومسلم :١٩٠٧ )

*'සියළුම ක්‍රියාවන් එහි අරමුණ අනුවම වේ.'*

- එසේම වුළු හි හිසේ සුළු කොටසක්, තෙත් කරගත් අතින් පිරිමැදීම (හෙවත් මස්හ් කිරීම) ශුද්ධ කුර්ආන් වැකියක් වන ((وَامْسَحُوْا بِرُؤُوْسِكُمْ)) මත පදනම් වී ඇත. මෙහි වචනාර්ථය '*ඔබලාගේ සිරස තෙත් කර ගන්න'* වේ.

- මෙසේ වන හදීස් හා කුර්ආන් උපදෙස්වලින් අවශ්‍ය නීති නිර්දේශයන් උපුටා දැක්වීම අල් ෆික්හ් නම් වේ.

**දෙවැන්න,**

- ෂරීයා නීති මාලාවද අල් ෆික්හ් යයි හඳුන්වනු ලැබේ. ඒ අනුව කෙනෙකු 'අල් ෆික්හ් ඉගෙන ගන්නේය' යනු ඔහු 'ශුද්ධ කුර්ආනයේ,ද හදීස් දැනුම් දීම්වලද, අල් ඉජ්මා අල් ඉජ්තිහාද් යනාදියෙන්ද උපුටා ගත් ෆික්හ් ග්‍රන්ථවල සඳහන් වී ඇති ෂරීයා නීතීන් දැන ගන්නේය' යන අදහස දේ.

- මෙයට නිදසුන් ලෙස වුළූහි නීතියන්, වෙළඳ ගනුදෙනු සම්බන්ධ නීති මාලාවන් ගෙන හැර දැක්විය හැක.

මෙවැනි නීති නිර්දේශයන්ට සාමාන්‍ය භාවිතයේදී 'අල් ෆික්හ්' යයි පවසනු ලැබේ.

ඉහත දැක්වූ විග්‍රහයන් දෙක කෙටියෙන් දැක්වුවහොත් ,පළමුව නීතීන් හැදෑරීමට ෆික්හ් යයි පවසනු ලබන අතර දෙවනුව එම නීති මාලාවන්ට ආමන්ත්‍රනයක් ලෙසින්ද මෙම වචනය උපයෝගී කරනු ලැබේ.

**اِرْتِبَاطُ الْفِقْهِ بِالْعَقِيْدَةِ الْاِسْلَامِيَّةِ**

**ඉස්ලාමීය ප්‍රතිපත්තීන් සමග ෆික්හ් නිර්දේශයන්ට තිබෙන බැඳීම**

ඉස්ලාමීය ෆික්හ් මාලාවේ විශේෂිතම ලක්ෂණය නම් එය අල්ලාහුතආලා මත සම්පූර්ණ විශ්වාසය ගොඩ නගා ගැනීමේ එකම පරමාර්ථයෙන් සැදුම් ලැබ තිබීමයි. මන්ද යත් අල්ලාහුතආලා මත වන ස්තිර විශ්වාසය, ෂරීයා නිතීන් පිලිපැදීමට මිනිසා යොමු කරන ප්‍රධානතම බලවේගය වන හෙයිනි. මෙම අන්තර් සම්බන්ධය ගැන අල්ලාහු තආලා ශුද්ධ කුර්ආනයේ බොහෝ තැන්වල අවධාරණය කර සිටී.

اَلَّذِيْنَ يُقِيْمُوْنَ الصَّلَاةَ وَيُؤْتُوْنَ الزَّكَاةَ وَهُمْ بِالْآخِرَةِ هُمْ يُوْقِنُوْنَ ( سورة النمل : الاية ٣ )

*'ඔවුන් කවුරුන්ද යත් සලාතය ඉටු කරන්නෝය. තවද සකාත්ද ගෙවන්නෝද වෙති. (තවද) අවසාන දිනය ස්තිරවම විශ්වාස කරන්නෝද වෙති.'*

ඉහත ශුද්ධ වැකියේ අල්ලාහුතආලා නැමදීම හා සකාත් ගෙවීම පළමුව සඳහන් කොට පසුව එය අවසාන දිනය විශ්වාස කිරීම හා එක්කොට ඇත. මෙලෙසින් ශුද්ධ කුර්ආන් වැකි බොහෝමයක්, ධර්මයේ නීති මාලාවන් සියල්ල අල්ලාහු විශ්වාස කිරීම හා එක් කිරීමෙන් අවසන් කරනු දැකිය හැක.

**شُمُوْلُ الْفِقْهِ الْاِسْلَامِيْ لِكُلِّ مَا يَحْتَاجُ إِلَيْهِ النَّاسُ**

***ජීවිත කාලයේ මනුෂ්‍යයාට හමුවන සෑම සංසිද්ධියකටම අල් ෆික්හ් නිර්දේශ දක්වා ඇත.***

නිසැකවම මිනිසුන්ගේ ජීවිත විවිධාකාරය. ඔවුන් මුහුණ දෙන්නට යෙදෙන සියළුම අවස්ථා ඉස්ලාම් ධර්ම මඟ පෙන්වීම් මත ගෙනෙමින් සිය ජීවිතය ධර්මානුකූලව ගත කළ යුතුය.

මේ නිසා අල් ෆික්හ් මිනිසා පත්විය හැකි සෑම තත්වයකටම අදාල මග පෙන්වීම් හා විසඳුම් ලබා දෙන්නක් වීම අනිවාර්ය වේ.

මේ අරමුණින් සම්පාදනය වී ඇති ෆික්හ් නීති මාලාවන් කාණ්ඩ 7 කින් සමන්විත වී ඇත.

<u>1 වැනි කාණ්ඩය</u>

මෙය අල්ලාහුතආලා සම්බන්ධ වූද ඔහු නැමදීම සම්බන්ධ වූද නිර්දේශ ඇතුලත් කොටස වේ. එනම් සලාත්, සකාත්, උපවාසය, හජ් වන්දනාව පිළිබඳ නීතීන් ඇතුලත් කොටස වේ. මෙයට (اَلْعِبَادَاتُ) ඉබාදත් නීති මාලාව යයි කියනු ලැබේ.

2 වෙනි කාණ්ඩය

මෙය පවුල් ජීවිතයට අදාල මග පෙන්වීම් ඇතුලත් කොටස වේ. එනම් විවාහය, දික්කසාදය, දේපළ හා උරුමයන් පිළිබඳ නීතීන් වේ. මෙයට (اَلْأَحْوَالُ الشَّخْصِيَّةُ) යයි පවසනු ලැබේ.

3 වැනි කාණ්ඩය

මෙය මිනිස් ක්‍රියාකාරකම් හා ගනුදෙනු සම්බන්ධ උපදෙස් අඩංගු කොටස වේ. එනම් උකස් කිරීම, විකිණීම, කුලියට ගැනීම, නඩු තීන්දු යනාදිය පිළිබඳ වේ. මෙයට (اَلْمُعَامَلَاتُ) යයි කියනු ලැබ්.

4 වැනි කාණ්ඩය

මෙය අල් හකීම් නම් වන විනිශ්චය කරුවෙකු සම්බන්ධ මග පෙන්වීම් හා නීතීන් අඩංගු කොටස වේ. මෙහි අරමුණ, අසාධාරණය, අපරාධය, වැලැක්වීම හා නීතිය ඉටු කිරීම යනාදිය වේ. තවද මෙම කාණ්ඩය රට වැසියෙකුගේ යුතුකම් ඉටුකිරීම පිළිබඳ නිර්දේශ දක්වයි. එනම් රටවැසියෙකු තුල තිබිය යුතු නීති ගරුක හා රාජ්‍ය හිතෛෂී බව පිළිබඳ නීති මාලාවන් අඩංගු කොටස වේ.

මෙම කොටසට ( اَلْأَحْكَامُ السُّلْطَانِيَّةُ) යනුවෙන්ද (اَلسِّيَاسَةُ الشَّرْعِيَّةُ) යනුවෙන්ද පවසනු ලැබේ.

5 වැනි කාණ්ඩය

මෙය අපරාධකරුවන්ට දඬුවම් පැමිණ වීමේ හා රාජ්‍ය ආරක්ෂාව පිලිබඳ නීති මාලාවන් ඇතුලත් කොටස වේ. ප්‍රාණ ඝාතකයන්ට හා සොරුන්ට දඬුවම් දීමේ ක්‍රමෝපායන් මෙහි නිර්දේශිතය. මෙම කොටස (اَلْعُقُوْبَاتُ) ( දඬුවම්) නම් වේ.

6 වැනි කාණ්ඩය

මෙය ඉස්ලාමීය රාජ්‍යයන් අන් රටවල් සමග පැවැත්විය යුතු රාජ්‍යාන්තික සබඳකම් පිළිබඳ උපදෙස් සහිත වන කොටස වේ. මෙම කොටස (اَلسِّيَرُ) නම් වේ.

7 වැනි කාණ්ඩය

මෙය සදචාරය, ගුණ යහපත් කම් හා එහි අගයන් හා දුරාචාරයන්ට වන දණ්ඩ නීතින්ද අඩංගු කොටස වේ. මෙය (اَلْآدَابُ وَالْأَخْلَاقُ) නමින් හැඳින් වේ. මේ අනුව අල් ෆික්හුල් ඉස්ලාම් යනු, මිනිසාට අවශ්‍ය සියළුම දැනමුතුකම් හා මග පෙන්වීම් හා දණ්ඩ නීති මාලාවන් නිර්දේශ කරන අංගසම්පූර්ණ සම්පාදනයක් ලෙස හැඳින්විය හැක.

මෙහි තවත් විශේෂිත වූ කැපී පෙනෙන ලක්ෂණයක් නම් මෙහි අඩංගු සියළුම නීතීන් හා මග පෙන්වීම් මිනිසාගේ උන්නතිය උදෙසාද, මිනිස් හැකියාවන් හා එහි සීමාවන් සැලකිල්ලට ගෙනද කෙටුම් පත් කර තිබීමයි. මෙහි කිසිදු නීතියක් හෝ නිර්දේශයක් පුද්ගලික නොහැකියාවන් නොසලකන හෝ අසීරු තාවයන්ට පත් කරන්නක් හෝ නොවේ. පවතින්නා වූ හා නිර්දේශිත යම් කටයුත්තක් විශේෂිත වූ පුද්ගල හැකියාවකට ඉසිලිය නොහැකි නම්, ඒ සඳහා බල කිරීමක් නොකොට එය සඳහා විකල්ප ක්‍රියාමාර්ග නිර්දේශ කරමින් අල් ෆික්හ් සිය මග පෙන්වීම් නම්‍යශීලීව කරනු දැකිය හැක.

ඉස්ලාම් ධර්මය ප්‍රායෝගික වූද මිනිසා අසීරුවට පත් නොකරන්නාවූද ධර්මයක් බවද ඉඳුරා කියමින් අල්ලාහුතආලා සිය ශුද්ධ වැකියක් මෙසේ පහල කර ඇත.

وَمَا جَعَلَ عَلَيْكُمْ فِيْ الدِّيْنِ مِنْ حَرَجٍ

*'ඔහු මෙම ධර්මයේ ඔබට කිසිදු අසීරුතාවයක් අණ නොකළේය'*

يُرِيْدُ اللهُ بِكُمُ الْيُسْرَ وَلاَ يُرِيْدُ بِكُمُ الْعُسْرَ

*'අල්ලාහ් ඔබලාට පහසුවම පතයි. අසීරු බවක් අදහස් නොකරයි.'*

لاَ يُكَلِّفُ اللهُ نَفْسًا اِلاَّ وُسْعَهَا

*' කිසිවෙකු ඔහුගේ ශක්තිය ඉක්මවා (යමක් කිරීමට) බල කරනු නොලබයි' යයිද*

وَقَالَ النَّبِيُّ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمْ اِنَّ الدِّيْنَ يُسْرٌ ( رواه البخاري ٣٩ )

*'නිශ්චය වශයෙන් මෙම ධර්මය පහසු එකකි' යයිද නබි තුමානන් පවසා ඇත.*

මෙයට නිදසුනක් ලෙස පහත නබි වැකිය දැක්විය හැක

قَالَ رَسُوْلُ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمْ صَلِّ قَائِمًا فَاِنْ لَمْ تَسْتَطِعْ فَقَاعِدًا فَاِنْ لَمْ تَسْتَطِعْ فَعَلَى جَنْبٍ (رواه البخاري ١٠٦٦ )

*'සලාතය සිටගෙන ඉටු කරනු. එය අපහසු නම් වාඩිවී ඉටු කරනු. එයද අසීරු නම් දිගාවී ඉටු කරනු.'*

مَصَادِرُ الْفِقْهِ الإِسْلاَمِيْ

<u>අල් ෆික්හුල් ඉස්ලාමි පදනම් වී ඇති මූලාශ්‍රයන්</u>

'අල් ෆික්හුල් ඉස්ලාමි' යනු ප්‍රධාන මූලාශ්‍ර 4 ක් පදනම් කොට ගත්තකි. ඒවා

1) අල් කුර්ආන් (اَلْقُرْآنُ)
2) අස්සුන්නා (اَلسُّنَّةُ)
3) අල් ඉජ්මා (اَلإِجْمَاعُ)
4) අල් කියාස් (اَلْقِيَاسُ) නම් වේ.

<u>අල් කුර්ආන් (اَلْقُرْآنُ الْكَرِيْمُ)</u>

මෙය සර්වබලධාරී අල්ලාහ්ගේ කථනයයි. මිනිස් වර්ගයා පාපයේ අඳුරෙන් මුදවා සත්‍යාලෝකයට ගෙනෙන අටියෙන් මෙම උතුම් මග පෙන්වීම සිය දූතයා වන නබි මුහම්මද් සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමානන්ට හෙතෙම අණාවරනය කළේය. ඉස්ලාමීය ධර්ම නීති පද්ධතියේ ප්‍රධානම පදනම හා උල්පත මෙයයි. කිසියම් නීතිමය ගැටළුවක් ඇති වූ විටෙක අපගේ අවධාණය පළමුවෙන් යොමු විය යුත්තේ ශුද්ධ කුර්ආනය දෙසටය.

උදහරණයකට වෙළෙඳම හෝ පොලිය පිලිබඳ ගැටළුවකදී අපට අවශ්‍ය මග පෙන්වීම් ශුද්ධ ග්‍රන්ථයේ ඇත.

وَاَحَلَّ اللهُ الْبَيْعَ وَحَرَّمَ الرِّبَا  ( سورة البقرة : الآيَةُ ٢٧٥ )

*' අල්ලාහ් වෙළෙඳම අනුමත කොට පොලිය තහනම් කරයි'*

එනිසා ඒ හා වන නීතීන් සඳහා අනෙකුත් මූලාශ්‍රයන් නිරීක්ෂීම අවශ්‍ය නොවේ. ශුද්ධ කුර්ආනය මිනිසාට අවශ්‍ය සියළුම නිරාකරණයන් දක්වන නමුත් ඒවා එහි සඳහන් වන්නේ ප්‍රතිපත්තිමය ලෙස හෙවත් සිරස්තල හැටියට පමණක් බව සැලකිය යුතුය. අල්ලාහ් පිළිබඳ පැහැදිලි කිරීම් ඉතා විස්තරාත්මකව හා නොමසුරු වචන යෙදීම්වලින් කරනු ලැබ ඇතත්, නීතිමය වැකියන් කෙටියෙන් හා යටිතල පැහැදිලි කිරීමකින් පමණක් ඉදිරිපත් කර තිබීම ශුද්ධ ග්‍රන්ථයේ විශේෂිත ලක්ෂණයකි. එයද හේතු රහිත නොවේ.

සලාතය පිළිබඳ වැකියන් දෙස බලමු. ඒ පිලිබඳ ඉතා කෙටියෙන් අණ කරනු ලබන අතර සලාතයේ වාර ගනන හෝ රකඅත් සංඛ්‍යාව පිළිබඳ කිසිවක් ශුද්ධ කුර්ආනයේ විස්තර කර නොමැත. එහි දෙවන අධියර සඳහා අස්සුන්නාහ් වෙත යොමු විය යුතුව ඇත. මෙනිසාම නබිතුමාන්ගේ සුන්නාහ් හෙවත් චර්යාව කුර්ආනය සමග සමාන්තරව ගමන් ගන්නක් බව සඳහන් කළ හැක.

<u>අස්සුන්නාහ් (اَلسُّنَّةُ الشَّرِيْفَةُ)</u>

අස්සුන්නාහ් යනු නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමානන්ගේ වාචික උපදෙස් ප්‍රායෝගික නිදසුන් හා නිහඬ අනුමැතිය ලැබූ ක්‍රියාවන් යනුවෙන් තුන් වැදෑරුම් වේ. මේ තුන් ඉරියව් අනුමැතියන් කෙටියෙන් විග්‍රහ කරමු.

<u>වාචික උපදෙස්</u>

එනම් එතුමන් සිය ප්‍රකාශයෙන්ම කළ උපදෙස් වේ. මෙයට නිදසුනක් ලෙස ප්‍රකාශිත හදීස් උපදේශයන් ගත හැක. විටෙක එතුමන් පැවසූහ.

قَالَ النَّبِيُّ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمْ ((سِبَابُ الْمُسْلِمِ فُسُوْقٌ وَقِتَالُهُ كُفرٌ)) (رواه البخاري: ٤٨ ومسلم: ٦٤)

*'මුස්ලිම් සොහොයුරෙකුට බැණ වැදීම පාපයකි. ඔහු ඝාතනය කිරීම කුෆ්ර් නම් වූ ධර්මයට පිටුපාන ක්‍රියාවකි.'*

<u>ප්‍රායෝගික අනුමැතියන්</u>

මෙය නබිතුමන් ක්‍රියාවෙන්ම නිදසුන් දක්වා අනුමැතිය දුන් කරුණු වේ.

مَارواه البخاري عَنْ عَائِشَةَ رَضِىَ اللهُ عَنْهَا لَمَّا سُئِلَتْ مَاكَانَ يَصْنَعُ رَسُوْلُ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ فِيْ بَيْتِه ؟ قَالَتْ : كَانَ يَكُوْنُ فِيْ مَهْنَةِ اَهْلِه ، فَاِذَا حَضَرَتِ الصَّلَاةُ قَامَ إِلَيْهَا

*'විටෙක නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමානන් නිවසේදී ක්‍රියාකරන ආකාරය යම් කිසිවෙකු ආයිෂා තුමියගෙන් විතාලේය. එයට එම උත්තමාව 'නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමානන් නිවසේදී අපගේ කටයුතුවලට උදව් වෙති. සලාතය සඳහා වූ මොහොතේදී ඒ සඳහා පිටත්ව යති' යයි පැවසුවාය.*

<u>නිහඬව අනුමත කළ ක්‍රියාවන්</u>

මෙය නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමානන් තෙමේම නොකළ නමුත් අනෙකෙකු කරනු බලා නිහඬව සිටි ක්‍රියාවන් වේ. මෙයට නිදසුනක් නම්

مَارواه ابوداود (١٢٦٧) ان النبي صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ رَأى رَجُلاً يُصَلّى بَعْدَ صَلاَةَ الصُّبْحِ رَكَعَتَيْنِ فَقَالَ ((صَلاَةُ الصُّبْحِ رَكَعَتَعَانِ)) فَقَالَ الرَّجُلُ : إِنِّي لَمْ اَكُنْ صَلَّيْتُ الرَّكَعَتَيْنِ الَّتِيْ قَبْلَهُمَا فَصَلَّيْتُهُمَا اْلآنَ فَسَكَتَ رَسُوْلُ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ

***'විටෙක යම් කිසිවෙකු අළුයම වන්දනය වන සුබහ් ඉටු කිරීමෙන් පසු රකඅත් දෙකක් අමතරව ඉටු කරනු දුටු රසූල් සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමානන් 'සුබහ් වන්දනය රකඅත් දෙකක් පමණකි' යයි පැවසූහ. එවිට එම තැනැත්තා තමාට සුබහ් වන්දනයට පෙරවන රකඅත් දෙක ඉටු කිරීමට නොහැකිවූ බව පවසා තමා දැන් ඉටු කලේ එම රකඅත් දෙක බව කියා සිටියේය. එවිට නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමානන් කිසිත් නොබැන සිටියහ. අනිවාර්‍ය සලාතයකට පෙර වන සුන්නත් සලාතයක් අතපසු වූ විටෙක එය පසුවද ඉටු කර ගත හැකිය යන නෛතික පදනමට පෙර කී සිද්ධිය පාදක කොට ගන්නා ලදී.***

එම නිසා ශුද්ධ කුර්ආනයට පසු නීති විග්‍රහයන් සඳහා විමසිය යුත්තේ අස්සුන්නාහ් නම් වූ නබි තුමානන්ගේ පුද්ගලික නිර්දේශයන් බව වටහා ගත යුතුය. ශුද්ධ කුර්ආනය වටහා ගැනීමට අස්සුන්නාහ් අත්‍යවශ්‍යම මගපෙන්වීමේ සාධකය බවද දත යුතුය. ඒ අනුව ක්‍රියා කිරීම සෑම මුස්ලිම්වරයෙකුටම 'වාජිබ්' ගනයේ යුතුකමක් වේ.

පෙරකී පරිදි සලාතයේ අණ ශුද්ධ කුර්ආනයේ කෙටුම් පත් වී ඇතත් එය ක්‍රියාත්මක කරන ආකාරය හා ඒ සම්බන්ධ අංග සම්පූර්ණ පැහැදිලි කිරීම් දැන ගැනීමට අපට අස්සුන්නාහ් අත්‍යාවශ්‍ය වේ.

විටෙක නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමානන් මෙසේ පැවසීම ඉහත ප්‍රකාශයේ පදනම ලෙස ගත හැක.

قَالَ رَسُوْلُ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمْ ((صَلُّوْا كَمَا رَاَيْتُمُوْنِيْ اُصَلِّيْ)) (رواه البخاري)

***'මා සලාතය ඉටු කරනු ඔබ දකිනා ලෙසින්ම එය ඉටු කරනු'***

<u>අල් ඉජ්මා (اَلإِجْمَاعُ)</u>

ඉජ්මා යනු සමකාලීනව ජීවත් වන රසූල් සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමානන්ගේ විශ්වාසික ජන කොටසට අයත් **මුජ්තහිද්** නම් වූ සත්‍යශීලී ධර්මාචාර්යවරුන් බහුතරයක් එක්සත් වී ගන්නාවූ ඒතමතික **ෂරීයා** රීතියන්ට කියනු ලැබේ. එසේ ගනු ලබන තීරණයකට හෝ නිර්දේශයකට අවනත වීම, එකල්හි ජීවත් වන මුළු මහත් මුස්ලිම් ජනයාට වාජිබ් නම් වූ ප්‍රබල යුතුකමක් වන්නේය.
**අල් ඉජ්මා** සඳහා වන ඉස්ලාමීය නෛතික පදනම කුමක්ද?

روى احمد في مسنده (٦/٣٩٦ ) عن ابن بصرة الغفاري رَضِىَ اللهُ عَنْهُ : ان رسول الله صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّم قَالَ : ((سَأَلْتُ اللهَ عَزَّ وَجَلَّ اَنْ لأَيَجْمَعَ اُمَّتِيْ عَلَى ضَلاَلَةٍ فَأَعطَانِيْهَا))

***රසූල් සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමානන් විටෙක මෙසේ පැවසූහ. 'මා අල්ලාහුතආලාගෙන් නොමග යෑමකදී මාගේ ජනයා සියල්ලෝම එක්සත් නොකරන මෙන් අයැද සිටියෙමි. එම කන්නලව්ව පිලි ගනු ලැබින'***

<u>අල් ඉජ්මා අවශ්‍යවන වාතාවරණය කුමක්ද?</u>

කෙනෙකු අභාවයට පත් වූ විට ඔහුගේ පියා නොමැතිව පුතා සහ සීයා ජීවත්ව සිටියි නම්, මැරුණු තැනැත්තාගේ දේපළින් ඔහුගේ පියාට හිමිවිය යුතු 6 න් එක් කොටස සීයාට හිමි විය යුතුයි යන රීතිය, සහාබාවරු එක්සත් වී තීන්දු කර ගැනීම මෙයට නිදසුනකි.

එනම් නවීන හා විශේෂිත අවශ්ථාවකට පමණක් අදාල වන නීතිමය අවශ්‍යථාවයක් පැන නැගී ඒ සඳහා පැහැදිලි නිර්දේශ කුර්ආනයෙන් හෝ අස්සුන්නාහ් වෙතින් ලබා ගත නොහැකි විට අප අල් ඉජ්මා වෙත යොමු විය හැක. මේ අපට තිබෙන තෙවන විකල්පයයි.

<u>අල් කියාස් (اَلْقِيَاسُ)</u>

මෙය පෙර කී ශුද්ධ කුර්ආන් අස්සුන්නාහ් හෝ අල් ඉජ්මා හි නිර්දේශ නොකළ රීතියක් එහි සඳහන් එක් රීතියක හේතු කාරකය සමග සැසදේ නම් එවිට අදාල වන සිව්වැනි මූලාශ්‍රයයි.

එනම් ශුද්ධ කුර්ආනයේ (اَلْخَمْرُ) යන 'වයින්' පානය තහනම් කොට ඇත. මෙයට හේතුව එහි තිබෙන මධ්‍යශාරයයි. ඒ මත වයින් නොවන අන් මත් පැන් හෝ ද්‍රව ස්වරූපයෙන් නොවන මත් බව දෙන සියළු ද්‍රව්‍ය හරාම් නම්වූ දැඩි තහනමට ලක් කිරීම 'අල් කියාස්' වේ.

අල් ෆික්හුල් ඉස්ලාමී කෙරෙහි අප ස්තිරවම එල්බ සිටිය යුතුය යන්න ඉහත පැහැදිලි කිරීම් වලින් වැටහේ. අල් ෆික්හුල් ඉස්ලාමීයේ සියළුම උපදෙස් ශුද්ධ කුර්ආනයේ ආඥා මත හා හදීස් වල මග පෙන්වීම් මත ගොඩනැගී ඇති බව පැහැදිලිය. අල් ඉජ්මා හා අල් කියාස් ද මූලාශ්‍ර කොට ගන්නේ පෙර කී ප්‍රධාන මූලයන් බවද දත යුතුය. එහෙයින් සමස්තයක් හැටියට අල් ෆික්හුල් ඉස්ලාමී නිර්දේශයන් ඉවත දැමීම ශුද්ධ කුර්ආනයද අස්සුන්නාහ්වද නොසලකා හැරීමට සමාන පාපයක් බවද අවධාරණය කර ගත යුතුය. එයට අවනත නොවීම ඉස්ලාම් ධර්මයෙන් ඉවත් වීමේ අවදානම වුවද ඇති කළ හැකිය. මන්ද, මුස්ලිමෙකු යනු වචනාර්ථයෙන්ම අල්ලාහුතආලා සහ ඔහුගේ රසූල් සල්ලල්ලාහු අලෛහිවසල්ලම් වරයානන් ගෙන ආ ධර්මය පිළිගෙන අවනත වන්නා නම් වේ.

තවද මෙම අල් ෆික්හුල් ඉස්ලාම් යනු ස්තිර වූද වෙනස් නොවන සුළුද නීතිමාලාවකි. කිසි විටක මුස්ලිමෙකු මෙයින් ඉවත් වීම හෝ එයට පිටුපෑම නොකළ යුතුය.

අල් ෆික්හුල් ඉස්ලාම් අනුව ක්‍රියා කළ යුතුය යන්නට ශුද්ධ කුර්ආන්හිද ප්‍රතිපාදන ඇති බව කිව හැක. අල් හදීස් වතින්ද මේ සඳහා සාධක උපුටා දැක්විය හැක.

ශුද්ධ කුර්ආනයේ අල්ලාහුතආලා මෙසේ අණ කරයි

((اِتَّبِعُوْا مَا اُنْزِلَ إِلَيْكُمْ مِنْ رَّبِّكُمْ وَلاَ تَتَّبِعُوْا مِنْ دُوْنِهِ اَوْلِيَاءَ)) (سورة الاعراف : الاية ٣ )

***'නුඹලාගේ දෙවියන් විසින් පහළ කර ඇති දෑ පිළිපදිනු. ඔහු නොවන අය නුඹලාගේ රක්ෂා කරුවන් හැටියට පත් කර නොගනු'***

***අල් කුර්ආන්***

තවත් වැකියක

((وَمَا آتَاكُمُ الرَّسُوْلُ فَخُذُوْهُ وَمَا نَهَاكُمْ عَنْهُ فَانْتَهُوْا)) (سورة الحشر: الاية ٧ )

***'මෙම දූතයා ඔබ වෙත ගෙන ආ දෙය පිළිගනු. ඔහු වළකන දේ ඉවත ලනු'***

***අල් කුර්ආන්***

තවද මේ පිලිබඳ අල්හදීස්හි මෙසේ සඳහන් වේ.

((تَرَكْتُ فِيْكُمْ مَا إِنْ اَخَذْتُمْ بِهِ لَنْ تَضِلُّوْا بَعْدِيْ : كِتَابُ اللهِ وَسُنَّتِيْ)) (رواه مسلم : ١٢١٨ )

***'මා ඔබලාට හිමි කර යන දේ තරයේ ග්‍රහණය කරගන්න. එවිට මාගේ අභාවයෙන් පසු නුඹලා නොමග නොයන්නහුය. එ(සේ ඔබලාට හිමි කරන) දෙය නම් ශුද්ධ කුර්ආනය හා මාගේ (සිරිත් විරිත් වන) අස් සුන්නාහ්ද වේ'***

## اَلتَّعْرِيْفُ بِبَعْضِ الْمُصْطَلَحَاتِ الْفِقْهِيَّة

## ෆික්හ් පාඩම සම්බන්ධයෙන් භාවිතා වන විශේෂ යෙදුම් සහ එහි පැහැදිලි කිරීම්.

### අල් ෆර්ල් (اَلْفَرْضُ)

**අල් ෆර්ල්** යනුවෙන් නිර්දේශිත ක්‍රියා මගින් අදහස් කරනුයේ, ෂරියා මගින් අනිවාර්යයෙන් කළ යුතු යයි අණ කරනු ලැබ ඇත්තාවූ ක්‍රියාවන්ය. ඒවා ඉටු කිරීමෙන් කුසල් ලැබෙන්නාක් මෙන්ම, ඒවා අත් හැරීමෙන් කටුක දඬුවම්ද ලැබෙනු ඇත.

මෙයට නිදසුනක් ලෙස අල්ලාහුතආලාගේ අණක් ගෙන හැර දක්වමු.

((كُتِبَ عَلَيْكُمُ الصِّيَامُ)) (سورة البقرة : الاية ١٨٣ )

*'උපවාසය ඔබලා මත වගකීමක් කර ඇත.'*

***අල් බකරා 183***

එහෙයින් උපවාසය ඉටු කිරීමෙන් අපමණ කුසල් ලබාගත හැකි අතර, එය හේතු රහිතව අත් හැරියහොත් දැඩි දඬුවම්වලටද ලක් විය හැක.

### අල් වාජිබ් (اَلْوَاجِبُ)

සාෆියී මද්හබ්හි අල් ෆර්ල් හා අල් වාජිබ් අතර කිසිදු වෙනසක් නොමැත. එනමුත් හජ් සම්බන්ධ නීති රීතින් හැර හජ් සම්බන්ධ නිර්දේශයන්හි හජ් ඉටු වීම කිනම් කරුණු මත රඳා නොපවතීද, එම ක්‍රියාවන් වාජිබ් වේ. එයින් අදහස් කරන්නේ කිනම් ක්‍රියාවන් අතහැරීම නිසා හජ් ඉටුවීමට හානි නොපැමිණේද, එවන් අවශේෂ ක්‍රියාවන් වාජිබ් ලෙස සැලකේ.

නිදසුනක් හැටියට මීකාත්හි සිට ඉහ්රාම් පැළඳීම, ගල් ගැසීම වැනි ක්‍රියාවන් අතපසු වුවද හජ් ඉටු වීමට කිසිදු බාධාවක් ඇති නොවේ. නමුත් එසේ අතපසු කරන්නා වන්දි ගෙවා නිදහස් විය හැකි ගනයේ වරදකට හසුවේ. ඔහු එම වන්දිය ඉටු කිරීමෙන් එනම් සතෙකු බිලි දීමෙන් එම වරදින් නිදොස් විය හැක.

එමෙන්ම හජ් සම්බන්ධ පාඩමෙහි කිනම් ක්‍රියාවන් මත හජ් ඉටු වීම රඳා පවතීද, එවැනි කරුණු අල් ෆර්ල් නම් වේ. එනම් කුමන ක්‍රියාවන් අත් හැරීමෙන් හජ් නිෂ්ප්‍රභා නම් වූ 'බාතිල්' වී අවලංගු වේද, එවැනි ක්‍රියාවන් වේ.

මෙයට නිදසුනක් වශයෙන් අරෆා පිටියේ රැඳී සිටීම ගෙන හැර දැක්විය හැක. අරෆාහි රැඳීම ඉටු නොවුවහොත් හජ් ඉටු නොවේ.

### ෆර්ල් අයින් (اَلْفَرْضُ الْعَيْنِيُّ)

මෙය එක් එක් පුද්ගලයෙකු විසින්ම ඉටු විය යුතු ක්‍රියාවන් වේ. යම් කොටසක් පමණක් ඉටු කිරීමෙන් නොකළ අය වග කීමෙන් නිදෙස් වන්නක් නොවේ. නිදසුනක් හැටියට පස් වේල් සලාතය හා රමලාන් උපවාසය යනාදිය කිව හැක.

### ෆර්ල් කිෆායා (اَلْفَرْضُ الْكِفَائِيُّ)

මෙය යම් කිසි පිරිසක් ඉටු කිරීමෙන්, කළ නොකළ සියල්ලෝම වගකීමෙන් නිදෙස් වනු ඇත. කෙනෙකු මරණයට පත් වී එම දේහය අවසන් කටයුතු ඉටු කිරීම, මේ ගනයට අයත් වේ. අවසන් කටයුතු ඉටු කරන පිරිස කුසල් ලබන අතර නොකළ එම පෙදෙස් වාසීහු වගකීමෙන් ගැලවෙති. නමුත් කිසිවෙකු හෝ එය ඉටු නොකළහොත්, එම මරණය සිදු වූ බලප්‍රදේශයේ ජීවත් වන සියළුම අය එම වග කීම පැහැර හැරීම සඳහා දඬුවම් ලබන්නෝය.

## අර්රුකූන් (اَلرُّكْنُ)

මෙය අනිවාර්‍ය ක්‍රියාවක් වුවද, එයම සම්පූර්ණ ක්‍රියාවලිය නොව ඉන් අංගයක් පමණි. උදහරණයකට සලාතයේම අංගයක් වන සජ්දව හා රුකූ ඉරියව් කිව හැක.

## අෂ්ෂර්ත් (اَلشَّرْطُ)

මෙය ඉටු කිරීම අවශ්‍ය වුවද, එය ක්‍රියාවලියකට ඇතුලත් වන්නක් නොවේ. එය ක්‍රියාවලියකට පෙර ඉටු විය යුත්තකි. නිදසුන් ලෙසින් සලාතයට පෙර වුළු කිරීම කිබ්ලාව දෙසට හැරීම යනාදිය සඳහන් කළ හැක. මේවා සලාතයේම අංගයන් නොවුවද සලාතය ඉටු වීමට අදල අත්‍යවශ්‍ය කොන්දේසින් වේ.

## අල් මන්දූබ් (اَلْمَنْدُوْبُ)

මෙය ඉටුකිරීමට ෂරියත් උපදෙස් දෙන නමුදු එය බල කර නොසිටියි. මෙය ඉටු කිරීමෙන් කුසල් ලැබෙන අතර නොකර සිටීමෙන් කිසිදු දඬුවමකට යටත් නොවේ. ලුහා වන්දනය හා සව්වාල් මසෙහි උපවාසයන් සය මෙයට නිදසුන් ලෙසින් දැක්විය හැක. අල් මන්දූබ් යන්න සුන්නත් (سُنَّةٌ), මුස්තහබ් (مُسْتَحَبٌّ), තතව්වුඃ (تَطَوُّعٌ), නෆීල් (نَفَلٌ), යන නම්වලින්ද හඳුන්වනු ලැබේ.

## අල් මුබාහ් (اَلْمُبَاحُ)

මේ වනාහි මෙවැනි ක්‍රියා ඉටු කිරීම හෝ අත් හැරීම සම වේ. ෂරියාව මෙවැනි ක්‍රියාවන් සඳහා අප බල නොකර ඇත්තා සේම වැලකී සිටීමටද අවවාද නොකරයි. නිදසුනක් ලෙස පහත ශුද්ධ වැකිය සඳහන් කළ හැක.

((فَاِذَا قُضِيَتِ الصَّلاَةُ فَانْتَشِرُوْا فِيْ الْاَرْضِ وَابْتَغُوْا مِنْ فَضْلِ اللهِ)) (سورة الجمعة : الاية ١٠ )

***'සලාතය ඉටු කිරීමෙන් භූමිය පුරා විසිර ගොස් අල්ලාහ්ගේ භාග්‍යයන් රැස් කර ගන්න'***
***අල් කුර්ආන්***

## අල් හරාම් (اَلْحَرَامُ)

ෂරියාව අප කිනම් ක්‍රියාවන්ගෙන් වැළකීම අනිවාර්‍ය කරත්ද, ඒවා 'හරාම්' නම් වේ. එසේ වැළකීමට කුසල් ලැබෙන්නා සේම එය කිරීමෙන් දඬුවම්ද ලැබේ. කෙනෙකුගේ දෙයක් අසාධාරණ ලෙස අත්පත් කර ගැනීම එවැනිම වූ මිනිස් ඝාතණය මෙයට නිදසුන් වේ.

((وَلاَ تَقْتُلُوْا النَّفْسَ الَّتِيْ حَرَّمَ اللهُ إلاَّ بِالْحَقِّ)) (سورة الاسراء : الاية ٣٣١ )

මෙයට 'මහ්ලූර්' (اَلْمَحْظُوْرُ), 'මඃෂියත්' (اَلْمَعْصِيَةُ), 'සන්බ්' (اَلذَّنْبُ), යන වචනයන්ද උපයෝගී කරනු ලැබේ.

## අල් මක්රූහ් (اَلْمَكْرُوْهُ)

අල් මක්රූහ් යන්න දෙවර්ගයකි. එය 'අල් මක්රූහ් තහ්රීම්' 'අල් මක්රූහ් තන්සීහ්' යනුවෙනි.

**<u>අල් මක්රූහ් තහ්රීම් (اَلْمَكْرُوْهُ التَّحْرِيْمِيُّ)</u>**

මෙය අත්හරින මෙන් ෂරීයාව උපදෙස් දෙයි. නමුත් 'හරාම්' වන දෙයක් තරමට බල නොකරයි. මෙයින් වැළකී සිටින්නාට කුසල් ලැබෙනා අතර එය කරන්නාට දඬුවම්ද ලැබේ. එනමුදු එම දඬුවම් හරාම් නම්වූ තහනම් ක්‍රියාවක් කරන්නෙකුට මෙන් බරපතල නොවේ. ඉර පායන විට හෝ බසින විට සුන්නත් සලාතයන් ඉටු කිරීම මේ ගණයට අයත් වේ.

**<u>අල් මක්රූහ් තන්සීහි (اَلْمَكْرُوْهُ التَّنْزِيْهِيُّ)</u>**

මෙවැනි ක්‍රියාවලින් වැළකී සිටින මෙන් ෂරීයාව ඉල්ලා සිටින නමුදු අණ නොකරයි. වැළකී සිටින්නාට කුසල් හිමි වේ. නමුත් එය කරන්නාට දඬුවම් කිසිවක් නොලැබේ. අරෆා සමයෙහි හාජිවරයෙකු උපවාසයේ යෙදීම මෙයට නිදනුනකි.

**<u>අල් අද (اَلْأَدَاءُ)</u>**

යම් වන්දනයක් ෂරීයාව නිර්දේශ කළ කාල සීමාව තුල ඉටු කිරීම 'අද' නම් වේ.

**<u>අල් කලාඃ (اَلْقَضَاءُ)</u>**

'අල් කලාඃ' යනු යම් ආගමික වතාවතක් ෂරීයා මගින් එයට නිර්දේශ කොට තිබෙන කාල සීමාව ඉක්මවූ පසු ඉටු කිරීම වේ. උදහරණයක් හැටියට රමලාන් උපවාසයක්, රමලාන් නොවන මසක ඉටු කිරීම කිව හැක.

යම් ආගමික වග කීමක් යම් බාධාවක් නිසා අතපසු වුවද, හේතු රහිතව අතපසු වුවද, එය කල් ඉක්මවා හෝ ඉටු කිරීම වාජිබ් ** වේ. එසේ වුවද යම් බාධාවක් නිසා අතපසු වීම පාපයක් නොවන අතර හේතු රහිතව අතපසු කිරීම පාපයක් ලෙස ගැනේ.

**<u>අල් ඉයාදත් (اَلْإِعَادَةُ)</u>**

මේ වනාහි යම් වන්දනයක් එහි පුණ්‍ය කුසල ලබා ගන්නා අටියෙන් නැවත ඉටු කිරීම වේ. එනම් කෙනෙකු ලුහර් වන්දනය තනිවම ඉටු කිරීමෙන් පසු කිහිප දෙනෙකු එක්ව එය ජමාත් වන්දනයක් හැටියට ඉටු කරනු දැක, එය සමග එක් වී නැවත ඉටු කිරීම මෙයට නිදසුනක් ලෙස දැක්විය හැක. මෙහි අරමුණ ජමාත්හි පුණ්‍ය කුසල ලබා ගැනීමයි.

## <u>පිරිසිදු වීම පිලිබඳ පාඩම (اَحْكَامُ الطَّهَارَةُ)</u>

පිරිසුදු වීම යනු ෂරීයා කෝණයෙන් සලාතය නැත්නම් එය හා සමාන අගයක් ඇති ක්‍රියාවන් සඳහා හැකියාව ලැබීම, එනම් වුළු නොමැත්තෙක් එයින් පිරිසිදු වීම, ස්නානය කාහට අනිවාර්‍ය වී ඇත්ද එවැන්නන් ස්නානය කිරීම තවද සිරුර වශ්ත්‍ර හා ස්ථානය අපවිත්‍ර දෙයින් රැක ගැනීම යනාදියට වන ව්‍යවහාරයකි.

**පිරිසිදුකමට ඉස්ලාම් ධර්මයේ ඇති වැදගත් කම**

පිරිසිදුකමට ඉහල ප්‍රමුඛත්වයක් ඉස්ලාම් ධර්මය සැම විටම දෙනු දැකිය හැක. එය ඊමාන් නම් දේව විශ්වාසයේ හරි අඩක් යයි ප්‍රකාශ කරන තරමට වැදගත් කරුණක් වේ. පහත සඳහන් ක්‍රියාවන්වලින් එය තව දුරටත් සනාථ කළ හැක.

- දිනපතා සලාතයන් සඳහා නැවත නැවත වුළු කිරීම.
- හැකි සෑම අවශ්ථාවකම ස්නානය කර ගත යුතුය යයි උනන්දු කරවීම.
- තවද නියපොතු කැපීම, දත් මැදීම, වශ්ත්‍ර පිරිසිදුව තබා ගැනීම හා නිතර මිස්වාක් කිරීම වැනි ක්‍රියාවන් ඉස්ලාම් ධර්මය ප්‍රබල ලෙස උනන්දු කර සිටියි.

ශුද්ධ කුර්ආනයේද අල්ලාහුතආලා මෙසේ පවසයි:

اِنَّ اللهَ يُحِبُّ التَّوَّابِيْنَ وَيُحِبُّ الْمُتَطَهِّرِيْنَ (سورة البقرة : الاية ٢٢٢ )

*'ඇත්තෙන්ම අල්ලාහ් (පාපය කෙරෙහි) පසුතැවිලි වන්නන්ද, පවිත්‍ර වුවන්ද ප්‍රිය කරන්නේය.'*

රසූල් සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමානන් පිරිසිදු කම පිලිබඳ මෙසේ උපදෙස් කළහ.

وَقَالَ النَّبِيُّ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ اَلطُّهُوْرُ شَطْرُ الْإِيْمَانِ (رواه مسلم)

*'පිරිසිදු කම ඊමානයේ අඩකි'*

<u>පිරිසිදු කම මෙතරම් වැදගත් වන්නේ ඇයි?</u>

ඉස්ලාම් ධර්මය පිරිසිදුකම ෂරීයාවේ ප්‍රබල නීතියක් බවට පත් කළේ හේතු රහිත නොවේ. ඉන් ප්‍රධාන හේතුව මනුෂ්‍යයාගේ ස්වභාවය පිරිසිදුකමට කැමැත්ත දක්වන හා අපිරිසිදුකම පිළිකුල් කරන අන්දමින් පිහිටා තිබීමය. ඉස්ලාම් ධර්මය මනුෂ්‍ය ස්වභාවය ඔස්සේ යමින් ඔහුට නිසි මඟ පෙන්වන ධර්මයක් වී තිබීමද පිරිසිදු කම ගැන උනන්දු කිරීමට එක් හේතුවක් වී ඇත.

- ❖ තවද යම් පුද්ගලයෙකුගේ ගරුත්වය රැක ගැනීමට ඔහු පිරිසිදුව සිටීම අවශ්‍ය බව නොරහසකි.
- ❖ තවද පිරිසිදුකම, සෞඛ්‍යය රැක ගැනීමට අවශ්‍ය පසුබිම වීමත් මෙයට තව ප්‍රධාන හේතුවකි. අපිරිසිදු සිරිත් විරිත් සෞඛ්‍යයට ඉතා අහිතකර දෙයක් බව අද කවුරුත් දනිති.
- ❖ තවද සර්වබලධාරී දෙවියන් ඉදිරියේ පෙනී සිටින්නා, අභ්‍යන්තර හා පිටස්තර අපිරිසිදු තත්වයන්ගෙන් මිදුනු කෙනෙකු වීමද මෙහිදී අපේක්ෂිතයි.

## <u>පිරිසිදු කරන ජලය ( اَلْمِيَاهُ الَّتِيْ يَتَطَهَّرُ بِهَا )</u>

අන් යමක් පිරිසිදු කරන ජලය යනු වැසි ජලය, ලිං ජලය, මුහුදු ජලය, ගංගා ජලය, උල්පත් ජලය හා මිදුනු පසුව දියවූ ජලය යනාදිය වේ. කෙටියෙන් කිවහොත් අහසින් සහ පොළොව යටින් ලැබෙන ජලය යයි මෙය හැඳින්විය හැකිය. මෙයට පහත සඳහන් ශුද්ධ කුර්ආන් වැකියද දෙස් දේ

وَيُنَزِّلُ عَلَيْكُمْ مِّنَ السَّمَاءِ مَاءً لِّيُطَهِّرَكُمْ بِهِ (سورة الأنفال : الاية ١١ )

*'එමගින් ඔබලා පිරිසිදු වීම සඳහා ඔහු අහසින් ඔබලාට ජලය පහල කරන්නේය.'*

## <u>اَقْسَامُ الْمِيَاه</u>

ජලය වර්ග 4 කට බෙදේ

1. طَاهِرٌ مُطَهِّرٌ
2. طَاهِرٌ مُطَهِّرٌ مَكْرُوْهٌ
3. طَاهِرٌ غَيْرُ مُطَهِّرٍ
4. مُتَنَجِّسٌ

## اَلطَّاهِرُ الْمُطَهِّرُ

මෙම ජලය අල්ලාහ්තආලා ආරම්භයේදී මැවූ සැටියෙන්ම කිසිදු වෙනසකට භාජනය නොවී තිබෙන ජලය වේ. මෙම ජලයට හිම් පොදු ගුණාංගයට එය කල් ඉකුත් වීමෙන් හෝ එය රැඳී තිබෙන පසෙහි ස්වාභාවය නිසා හෝ එය මත පාසි බැඳෙන නිසා හෝ එය එක් රැස් වී තිබෙන ස්ථානය නැත්නම් එය ගලා යන තැනෙහි ස්වාභාවය නිසා හෝ කිසිදු හානියක් ඇති නොවේ. තවද ඉහත කී අවශ්ථාවන්වලින් ජලය ඉවත් කිරීමද කළ හැකකක් නොවේ. මෙවැනි පොදු ජලය පිරිසිදුය යන්නට සාධකය මෙසේ දැක්විය හැකිය.

مَارَوَاهُ الْبُخَارِيُّ وَغَيْرُهُ عَنْ اَبِيْ هُرَيْرَةَ رَضِىَ اللهُ عَنْهُ قَالَ قَامَ اَعْرَابِيٌّ فَبَالَ فِيْ الْمَسْجِد فَقَامَ اِلَيْه النَّاسُ لِيَقَعُوْا به فَقَالَ النَّبِيُّ صَلَّى اللهُ عَلَيْه وَسَلَّم دُعُوْهُ وَهَرِيْقُوْا عَلَى بَوْلِهِ سَجْلاً مِّنْ مَّاءِ اَوْ ذُنُوبًا مِّنْ مَّاءٍ فَاِنَّمَا بُعِثْتُمْ مُيَسِّرِيْنَ وَلَمْ تُبْعَثُوْا مُعَسِّرِيْنَ

*'විටෙක නුගත් අරාබි ගැමියෙක් මස්ජිදයේ මූත්‍රා කළේය. කොපාවිෂ්ඨ වූ මිනිසුන් ඔහුට දඬුවම් කිරීමට තැත් කළහ. එවිට කාරුණ්‍ය නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමානන් ඔහුව අත් හැර දමන ලෙස පවසා, ඔහු අපිරිසිදු කළ තැන මත ජලය බාල්දියක් වත් කරන මෙන් උපදෙස් දුන්හ. මෙගින් ජලයට පිරිසිදු කිරීමේ හැකියාව ඇති බවට ෂරීයා පිළිගැනීම ලැබින.*

## اَلطَّاهِرُ الْمُطَهِّرُ الْمَكْرُوْهُ

මෙම ජලය වනාහි පිරිසිදු වුවද එයින් යම් දෙයක් පවිත්‍ර කිරීම අප්‍රසන්න වේ. සූර්‍ය තාපයෙන් රත් වූ ජලය මෙවැන්නකි. මෙම ජලය මක්රූහ් නම් පිළිකුලට ලක් වන්නේ කරුණු කිහිපයක් අදාල වුවහොත් පමණි.

- එය උෂ්ණාධික පෙදෙසක තිබීම.
- එම ජලය රැඳී තිබෙන භාජනය, (රන් රිදී හැර) යකඩ තඹ වැනි ගිනියම් කොට තැලීමෙන් යමක් සෑදීමට හැකි ලෝහයකින් සාද තිබීම.
- එම ජලයෙන් මිනිස් සිරුරක්, (මළ සිරුරක් වුවද) නැත්නම් සුදු කබර ඇතිකළ හැකි අශ්වයෙකු වැනි සතෙකුගේ සිරුරේ ගල්වනු ලැබීම.

ඉමාම් ෂාෆිඊ රලියල්ලාහු අන්හු මෙසේ පවසයි. උමර් රලියල්ලාහු අන්හු තුමා එවැනි ජලයෙන් නෑම හෙලා දුටුහ. තවද එතුමන් 'මා සූර්‍ය තාපයෙන් රත් වූ ජලයෙන් නෑම පිළිකුල් කරන්නේ, ශාරීරික හේතූන් නිසාමය. ඇයිද යත් එම ජලයෙන් නෑමෙන් සුදු කබර රෝගය හට ගැනේ' යයි අනතුරු ඇඟවූහ.

## اَلطَّاهِرُ غَيْرُ الْمُطَهِّرُ

මෙම ජලය වනාහි පිරිසිදු වුවද, තවත් දෙයක් පිරිසිදු නොකරයි. මෙයද වර්ග දෙක් වේ.

**පලමුවැන්න**

**الماء المستعمل**

අධි දේවනය හෝ නෑමට භාවිතා කළ 'කුල්ලතයින්' ප්‍රමාණයට වඩා අඩු ජලය.

මෙය පිරිසිදු ජලය බවට අදල සිද්ධිය:

مَارَوَاهُ الْبُخَارِيْ وَمُسْلِمْ عَنْ جَابِرِ بْنِ عَبْدِ اللهِ رَضِىَ اللهُ عَنْهُمَا قَالَ جَاءَ رَسُوْلُ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ يَعُوْدُنِيْ وَاَنَا مَرِيْضٌ لاَ اَعْقِلُ فَتَوَضَّاَ وَصَبَّ مِنْ وُّضُوْئِهِ عَلَيَّ

*ජාබීර් රලියල්ලාහු අන්හු, මෙසේ දන්වා සිටියි ' මම අසනීප වී සිහිසුන්ව සිටින විටෙක, නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමානන් පැමිණ ඇත්තාහ. එවිට එතුමානන් වුළු කළ ඉතිරි ජලය මගේ සිරුරට වත් කර ඇත්තාහ.*

මෙම ජලය අන් කෙනෙකු පිරිසිදු නොකරන බවට පහත සඳහන් සිද්ධිය නිමිති කොට ගෙන ඇත.

مَارَوَاهُ مُسْلِمُ وَغَيْرُهُ عَنْ اَبِيْ هُرَيْرَةَ رَضِىَ اللهُ عَنْهُ اَنَّ النَّبِيَّ صَلَّى اللهُ عَلَيْه وَسَلَّمَ قَالَ لاَ يَغْتَسِلُ اَحَدُكُمْ فِيْ الْمَاءِ الدَّائِمِ اَنْ الرَّكِدُ وَهُوَ جُنُبَ
فَقَالُوْا يَااَبَا هُرَيْرَةَ كَيْفَ يَفْعَلُ قَالَ يَتَنَاوَلُهُ تَنَاوُلاً

*අබූ හුරෙයිරා රලියල්ලාහු අන්හු, මෙසේ දන්වා සිටියි: නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම්තුමානන් මෙසේ පැවසූහ. එක් රැස්වී තිබෙන ජලයෙන් ඔබ කිසිවෙකු අනිවාර්‍ය නෑම ඉටු නොකරන්න.' එවිට ජනයන් 'අබූ හුරෙයිරා තුමනි එතුමන් එසේ නම් කෙසේ ස්නානය කළේද?' යයි විමසූහ. එයට අබූ හුරෙයිරා රලියල්ලාහු අන්හු 'එතුමානන් (නොගිල්වා) ජලය භාජනයකින් ගෙන මසිරුරෙහි වත් කරමින් ස්නානය කළහ' යයි විස්තර කළහ. මෙවැනි එක් රැස්ව තිබෙන ජලයේන අඩී දේවනය කිරීමේ රීතියද මෙලෙසම වේ. මෙම ජලයේ (ගිලී) නෑමෙන් පිරිසිදු විය හැක. ඉහත කියන ලද ජලය 'කුල්ලතයින්' ප(මාණයට වඩා අඩු ජල ප්‍රමාණයක් යනුවෙන් වෙනත් සිද්ධියක් අලලා තීන්දු කරනු ලැබ ඇත.*

දෙවැන්න

(الماء المتغير)

ඒ ජලයේ ස්වභාවය මත රැඳී නොතිබෙන තවද එම ජලය සමග මිශ්‍ර වූ පසු නැවත ඉවත් කර ගත නොහැකි යමක් (තේ වතුර සිසිල් බීම වැනි දේ) පොදු ජලය සමග මිශ්‍ර වීම වේ.

<u>اَلْمَاءُ الْمُتَنَجِّسْ</u>

මෙය අපිරිසිදු වූ ජලය වේ. මෙය කිනම් ජල ප්‍රමාණයක් සමග අපිරිසිදු යමක් මිශ්‍ර වූවාද එම ජලයට කියනු ලැබේ. එයද වර්‍ග දෙකකි.

**පලමුවැන්න: (اَلْمَاءُ الْقَلِيْل) අප්‍රමාණවත් ජලය**

එනම් 'කුල්ලතයින්' ප්‍රමාණයට වඩා අඩු ජලය. අපිරිසිදු යමක් මිශ්‍ර වීමේන් මෙම ජලය අපිරිසිදු වේ. මිශ්‍ර වූයේ සුළු ප්‍රමාණයක් වුවද එසේ මිශ්‍ර වීමෙන් ජලයේ පැහැය  සුවඳ හා රසෙහි කිසිඳු වෙනසක් නොවී තිබුනද එය අපිරිසිදුම වේ.

**දෙවැන්න : (اَلْمَاءُ الْكَثِيْر) ප්‍රමාණවත් ජලය**

මෙය 'කුල්ලතයින්' හෝ එයට වැඩි ප්‍රමාණයක් වන ජලයයි. අපිරිසිදු යමක් මි වූ පමණින් මෙම ජලය අපිරිසිදු නොවේ. එසේ  යමක් මිශ්‍ර වීමෙන් ජලයෙහි පැහැය  සුවඳ හා රසෙහි යම් වෙනසක් ඇති වී තිබුනහොත් පමණක් එම ජලය අපිරිසිදු බවට පත්වේ. මෙයට පක්‍ෂව මජ්මූ නම් ග්‍රන්ථයේ ඉමාම් නවවී රහ්මතුල්ලාහි අලෛහි මෙසේ සඳහන් කරති. ඕනෑම ප්‍රමාණයක (අඩු හෝ වැඩි) ජලයේ අපිරිසිදු යමක් මිශ්‍ර වී එහි පැහැය රසය හෝ සුවඳ වෙනස් වේ නම් එම ජලය අපිරිසිදු වූ බව සැලකිය යුතුය. මෙය උලමාවරුන්ගේ ඒකමතික තීරණයකි.

<u>අල් කුල්ලතයින් ( اَلْقُلَّتَانِ)</u>

'කුල්ලතෙයින්' යනු බග්දාද් රාත්තල් 500 ක් බරැති ජලය වේ. නවීන මිනුම් අනුව එය  කි.ගෑම් 210කි. එනම් රාත්තල් 663 ක් පමණද, ලීටරවලින් නම් 210.4 ක්ද ගැලුම්වලින් 46. 29 පමණද, හෙවත් හරි හතරැස් රියන් එකයි කාලක් පමණ බැරලයක් පිරෙන ප්‍රමාණයද වේ.

කුල්ලතයින් සඳහා අදල හදීස් දැන්වීම:

عَنْ عَبْدِ اللهِ بْنِ عُمَرَ رَضِىَ اللهُ عَنْهُ قَالَ سَمِعْتُ رَسُوْلَ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ وَهُوَ يُسْئَلُ عَنِ الْمَاءِ يَكُوْنُ بِالْفَلاَةِ مِنَ الْاَرْضِ وَمَا يَنُوبُهُ مِنَ السَّبَاعِ وَالدَّوَابِ فَقَالَ إِذَا كَانَ الْمَاءُ قُلَّتَيْنِ لَمْ يَحْمِلِ الْخُبُثَ

*අබ්දුල්ලාහ් ඉබ්නු උමර් රලියල්ලාහු අන්හු මෙසේ දන්වයි: 'අප නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමානන් වෙතින් එළිමහන් පෙදෙසක එක් රැස්වී තිබෙන ජල ප්‍රමාණයක් ගැනද, සතුන් සිව්පාවුන් එම ජලයෙන් පානය කිරීම පිලිබඳව (එය පිරිසිදුද යන්න) විමසූ විට එතුමන් 'එම ජලය කුල්ලතයින් ප්‍රමාණයේ තිබුනහොත් එය පිරිසිදු බව කීහ.'*

නමුත් ජලය කුල්ලතයින් ප්‍රමාණයට වඩා අඩු නම්, එය අපිරිසිදු වේ. ජලයෙහි පියවි වැටහීම්වලට වෙනසක් නොදැනුනද එය අපිරිසිදුම වේ.

قَالَ النَّبِيُّ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ إِذَا اسْتَيْقَظُ اَحَدُكُمْ مِنْ نَّوْمِهِ فَلاَ يَغْمِسْ يَدَهُ فِيْ الْمَانَاءِ حَتَّى يَغْسِلُهَا ثَلاَثًا فَاِنَّهُ لاَ يَدْرِي اَيْنَ بَاتَتْ يَدَهُ (رواه مسلم)

*කාරුණ්‍ය නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් මෙසේ පැවසූහ. 'ඔබගෙන් කිසිවෙකු නින්දෙන් අවදිවූ වහාම දෑත් සෝද නොගෙන බඳුනක් තුලට නොදමනු. ඇයි ද යත් නිදගෙන සිටින විට ඔබගේ දෑත් කුමන තැන්වලට දමනු ලැබුවේ දැයි ඔබලා නොදන්නෙහිය.*

තවද නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමානන් නින්දෙන් අවදි වූවෙකුගේ අත, සෝද නොගෙන ජල බඳුනක් තුලට දැමීම තහනම් කළහ. ඇසට නොපෙනෙන අපවිත්‍ර දේ දෑතෙහි තිබෙන්නට පුළුවන. එවැනි අපවිත්‍ර දේ ජලයේ පැහයද වෙනස් නොකරයි. නමුත් ජලය අපවිත්‍ර වේ.

**පිරිසිදු කිරීම සඳහා භාවිති කළ හැකි ජලය**

ඉහත සඳහන් සියළුම ජල වර්ග කිසිදු දෙයක් පිරිසිදු නොකරයි. නමුත් පලමු හා දෙවැනි වර්ගයන් පමණක් යමක් පිරිසිදු කරයි. එනමුත් දෙවැනි වර්ගය සිරුරෙහි උපයෝගී කිරීම මක්රූහ් නම් වූ අප්‍රිජනක කාර්‍යයකි.

තුන්වැනි වර්ගය යමක් පිරිසිදු නොකළද, එය තෙමේම පිරිසිදු නිසා එය බීම සඳහාද ආහාර පිසීම සඳහාද උපයෝගී කළ හැක.

සිව්වැන්න කිසිවකට උපයෝගී කළ නොහැක්කකි.

## <u>බඳුන් (اَلْاَوَانِيْ)</u>

අල් අවානි යනු ද්‍රව හෝ අන් යමක් බහා තබන බඳුන් වේ.

**1. රන් හා රිදී බඳුන් පිළිබඳ රීතින්.**

රන් රිදී බඳුන් කිසිවකට භාවිතා කළ නොහැක. නමුත් විකල්පයක් නොමැති අකරතැබ්බයකදී ඒවා උපයෝගී කළ හැක.

عَنْ حَذَيْفَةَ رَضِىَ اللهُ عَنْهُ قَالَ سَمِعْتُ رَسُوْلَ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ يَقُوْلُ لاَ تَلْبِسُوْا الْحَرِيْرَ وَلاَ الدِّيْبَاجَ وَلاَ تَشْرِبُوْا فِيْ آنِيَةِ الذَّهَبِ وَالْفِضَّةِ وَلاَ تَأْكُلُوْا فِيْ صَحَافِهَا فَاِنَّهَا لَهُمْ فِيْ الدُّنْيَا وَلَنَا فِيْ الْآخِرَةِ

*නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම්තුමානන් මෙසේ පැවසූහ: 'ඔබලා පට සළු නොඇඳින්න. තවද රන් රිදී බඳුන්වලින් පානය නොකරන්න. එයින් ආහාර අනුභවයද නොකරන්න. එය මෙලොවෙහි කාෆිර්වරුන්ට හිමිය. එලොව අප සතුය.'*

ඉහත තහනම ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව පිළිපැදිය යුත්තකි. එසේම ඒවා කිසි ප්‍රයෝජනයක් නොගෙන අලංකාරය සඳහා රැස් කර තැබීමද එකසේ තහනම් ක්‍රියාවන් වේ.

**2. රන් හෝ රිදී යොද සිදුරු පාස්සනු ලැබූ බඳුන් භාවිතා කිරීමේ රීතිය පහත සඳහන් ලෙස වේ.**

පොදුවේ එවැනි බඳුන් උපයෝගී කිරීම තහනම් වේ. නමුත් කුඩා රන් හෝ රිදී පෑස්සීම් අලංකාරය සඳහා නොයොද සිදුරක් වැසීම සඳහා පමණක් යොද තිබුනහොත් එය භාවිතා කිරීමට අවසර ඇත. විශාල රන් රිදී පෑස්සීක් අලංකාරය සඳහා යොද තිබුනහොත් එය හරාම් වේ. එසේම කුඩා රන් හෝ රිදී යෙදුමක් අලංකාරය සඳහාද ලොකු රන් රිදී යෙදුමක් සිදුරක් වැසීම සඳහා යොද තිබුනද එම භාජනය භාවිතා කිරීම මක්රූහ් නම් අප්‍රසන්න ක්‍රියාවකි.

ලොකු රන් රිදී පෑස්සීමක් අවශ්‍යතාවයකට උපයෝගී කිරීම හරාම් නොවේ. පහත සිද්ධිය මෙයට සාධකයක් වේ.

عَنْ عَاصِمِ الاَحْوَلِ رَضِىَ اللهُ عَنْهُ قَالَ رَاَيْتُ قَدْحَ النَّبِيُّ صَلَّى اللهُ عَلَيْه وَسَلَّمَ عِنْدَ اَنَسِ بْنِ مَالِك وَكَانَ قَدْ اِنْصَدَعَ فَسَلْسَلَهُ بِفِضَّةٍ وَقَالَ اَنَسٍ رَضِىَ اللهُ عَنْهُ لَقَدْ سَقَيْتُ رَسُوْلَ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ فِيْ هَذَا الْقَدْحِ اَكْثَرَ مِنْ كَذَا وَكَذَا ( رواه البخاري )

*ආසිමුල් අහ්වල් රලියල්ලාහු අන්හු මෙසේ විස්තර කර සිටියි. 'මා විටෙක රසූල් සල්ලල්ලාහු අලෛහිවසල්ලම්තුමන්ගේ බඳුනක් අනස් ඉබ්නු මාලික් රලියල්ලාහු අන්හු ගේ අතෙහි තිබෙනු දුටුවෙමි. එය කැඩී තිබී රිදියෙන් පාස්සා තිබිණි.*

*අනස් ඉබ්නු මාලික් රලියල්ලාහු අන්හු ද 'මම කිහිප වතාවක්ම නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමන්හට එම බඳුනේ ජලය දී ඇත්තෙමි' යයිද පවසයි.*

**3. අගනා ඛණිජයන් යොද සාදන ලද බඳුන් උපයෝගී කිරීමේ රීතින් මෙසේ වේ.**

මුතු , දියමන්ති වැනි අගනා ඛණිජයන්වලින් සාදන ලද බඳුන් උපයෝගී කිරීම 'ජායිස්' හෙවත් අනුමැතිය ලත් ක්‍රියාවකි. ඇයිද යත් මෙවැනි බඳුන් තහනම් කරන කිසිදු හදීස් හෝ කුර්ආන් නිර්දේශයක් සඳහන් වී නොමැත.

4. කාෆිර්වරුන් උපයෝගි කරන බඳුන් භාවිතා කිරීම පිළිබඳ රීතින් අනුව ඒවා භාවිතා කළ හැකි බව සඳහන් වේ. පහත සිද්ධිය එයට සාධකයකි.

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමානන් මෙසේ පැවසූහ.

اِنَّ النَّبِيَّ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ قَالَ فَاغْسِلُوْاهَا وَكُلُوْا فِيْهَا (رواه البخاري)

*(කාෆිර්වරුන්ගේ බඳුන්) සෝද ඒවායින් අනුභව කරන්න.*

එසේ පවසන ලද්දේ ඔවුන් උපයෝගී කරන විට මත් පැන් හා ඌරු මාංශ වැනි තහනම් දේ සඳහා ඔවුන් එම බඳුන් උපයෝගී කරන්නට ඇත යන සැකය මතයි. කාෆිර්වරුන්ගේ වස්ත්‍රයන් ඇඳීමේදීද මෙලෙසින්ම ක්‍රියා කළ යුතුය.

**<u>පිරිසිදු වීම පිළිබඳ පාඩම (اَنْوَاعُ الطَّهَارَةِ)</u>**

පිරිසිදු බව යන්න දෙවගීයකි.

පළමුවැන්න, අපවිත්‍ර දෙයින් පිරිසිදු වීම වන අතර දෙවැන්න අපගේම සිරුරේ අපවිත්‍ර තාවයකින් අප මිදී පිරිසිදු වීම වේ.

**<u>අපවිත්‍ර දෙයකින් පිරිසිදුවීම</u>**

'නජිස්' යන අරාබි වචනයෙන් සියළුම අපිරිසිදු දේ අදහස් කෙරේ. නමුත් ෂරියා කෝනයෙන් 'නජිස්' යනු සලාතය ඉටු කිරීමට බාධාවන කිළිටි හා අපවිත්‍ර දේ අදහස් කෙරේ. උදහරණයක් හැටියට රුධිරය හා මුත්‍රා සඳහන් කළ හැක.

**ස්වභාවයෙන්ම නජිස් වන දේ (اَلْأَعْيَانُ النَّجِسَةُ)**

මේවා බොහෝමයක් ඇතත්, ප්‍රධාන වශයෙන් 7 ක් ඇති අතර ඒවා පහත සඳහන් වේ.

1. අරක්කු ඇතුළු සියළුම මත් වන ද්‍රව්‍ය. අල්ලාහුතආලා මෙසේ පවසයි.

اِنَّمَا الْخَمْرُ وَالْمَيْسِرُ وَالْأَنْصَابُ وَالْأَزْلاَمُ رِجْسٌ (سورة المائدة : الاية ٩٠ )

***'නිශ්චය වශයෙන්ම මත් පැන් සූදුව ප්‍රතිමා වන්දනය ඊයක් විද පේණ ඇසීම යනාදිය නජිස් වේ.'***
***අල් මාඉද 9***

තවද නබි වැකියක මෙසේ සඳහන් වේ.

قَالَ رَسُوْلُ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ كُلُّ مُسْكِرٍ خَمْرٌ وَكُلُّ خَمْرٍ حَرَامٌ (رواه مسلم )

***'සියළුම මත් ද්‍රව්‍ය 'හම්ර්' නම් වේ. සියළුම 'හම්ර්' වගී හරාම් වේ.'***

2. 'තවද සුනඛයන් සහ ඌරන්ද වේ' යයි නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමානන් පැවසුහ.

قَالَ رَسُوْلُ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ طُهُوْرُ اِنَاءِ اَحَدِكُمْ إِذَا وَضَعَ فِيْهِ الْكَلْبُ اَنْ يَّغْسِلَهُ سَبْعَ مَرَّاتٍ اَوْ لاَهُنَّ بِالتُّرَابِ (رواه مسلم)

***'ඔබලාගේ භාජනයකට බල්ලෙකු මුඛය දැමුවහොත් එය පිරිසිදු කරන ක්‍රමය නම් සත් වරක් ජලයෙන් සේදීමය. එයින් එක් වරක් වැලි මිශ්‍ර කර සේදිය යුතුය.***

3. නිතැතින්ම මැරුණු සතුන්.

ෂරියා නීතින් අනුව නිර්දේශිත ක්‍රමයෙන් බාහිරව මරණ ලද හා මැරුණු සතුන් මෙම ගනයට වැටේ. අල්ලාහුතආලා මෙසේ පවසයි.

حُرِّمَتْ عَلَيْكُمُ الْمَيْتَةُ (سورة المائدة : الاية ٤ )

***'(නිතැතින්ම) මැරුණු දේ ඔබලාට තහනම් කර ඇත'***

එය නජිස් වන නිසා තහනම් කරන ලද්දේ යයි සිතා ගත හැක. මේ සමගම පිළිමයක නාමයෙන් හෝ අල්ලාහ් නොවන යමකගේ නාමයෙන් මරණ ලද සතුන්ද හරාම් සහ නජිස්ම වේ. මේ පිළිබඳ අල්ලාහ් මෙසේ පවසයි.

وَمَا اُهِلَّ لِغَيْرِاللهِ بِهِ (سورة المائدة )

*'අල්ලාහ් නොවන දේ සඳහා මරනු ලැබූ දේ (තහනම්ය)'*
එසේ වුවද මැරුණු ආකාරය කුමක් වුවද නජීස් නොවන තුනක් ඇත.

1. මිනිසෙකු මැරුණු පසු ඔහු කිලිටක් ලෙස නොසැලකේ. මේ පිළිබඳ ශුද්ධ කුර්ආන් වැකියක් මෙසේ වේ.

وَلَقَدْ كَرَّمْنَا بَنِيْ آدَمَ (سورة الإسراء : الاية ٧٠ )

*'අප ආදම්ගේ දරුවන් ගෞරවාන්විත කළෙමු'*

එහෙයින් මිනිසා සප්‍රාණිකව හෝ අප්‍රාණිකව සිටියද නජීස් නම් කිළිටක් ලෙස නොගැනේ. මේ පිළිබඳ හදීස් වැකියක් මෙසේ වේ.

سبحان الله ان المسلم لا ينجس

*'අල්ලාහ් පිවිතුරුය. නිශ්චය වශයෙන්ම මුස්ලිම්වරයෙකු කිළිටක් නොවේ.*

2 හා 3. ජලජ ජීවීන් හා පලා ගිරවා.

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් මෙසේ පැවසූහ.

اُحِلَّتْ لَكُمْ ...

*'ඔබලාට මැරුණු දෙකක් හා රුධිර වගී දෙකක් හරාම් නො වේ. ඒවානම් මතස්‍යයින් හා පලා ගිරවන්ද පීකුදු හා පෙනහළුද වේ.'*

4. ගලා යන රුධිරය තුවාලවල සැරවද එයටම අයත් වේ. අල්ලාහ් මෙසේ පවසයි:

اَوْ دَمًا مَّسْفُوْحًا اَوْ لَحْمَ خِنْزِيْرٍ فَاِنَّهُ رِجْسٌ (سورة الانعام :الاية ١٤٣ )

*'තවද ගලා යන රුධිරයද ඌරු මාංශද නිශ්චය වශයෙන්ම කිළිටි දේ වේ.'*

අපට අනුමැතිය ඇති ගව හා එළු වගීවල පීකුදු හා පෙනහළු අපට හලාල් වේ.

5. මනුෂ්‍ය මූත්‍රා සහ සතුන්ගේ මූත්‍රා පිළිබඳව ද හදීස් දැන්වීම්වල විස්තර කරනු ලැබ ඇත.
ان اعرابيا بال في المسجد فقال رسول الله صلى الله عليه وسلم صبّو عليه ذنوبا من ماء

'ගැමි අරාබි මිනිසෙකු මස්ජිදය තුල විටෙක මූත්‍රා කළේය. එවිට නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමානන් ඒ මත ජලය බාල්දියක් (පමණක්) වත් කරන මෙන් අණ කළහ. මෙම සිද්ධිය, මූත්‍රා අපවිත්‍ර දෙයක් බව සනාථ කරයි.

6. 'යම් සතෙකු පණ පිටින් සිටින විට උගෙන් වෙන්වූ අවයවයක්, නජීස් නම් වූ අපවිත්‍ර දෙයක් වේ' යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමානන් පැවසූහ.

ما قطع من بهيمة فهو ميتة (رواه الحاكم)

*ඇයිද යත් එසේ වෙන් වන අවයවය මැරුණු අවයවයක්ම වේ.*

එසේ වුවද අපට ආහාරයට අනුමත වූ සතුන් මැරුණු පසුවද අපවිත්‍ර නොවේ. උන්ගේ රෝමයන්ද, අවයවද එසේමය.

අල්ලාහ් මෙසේ ශුද්ධ ග්‍රන්ථයේ පවසයි.

وَمِنْ اَصْوَافِهَا وَاَوْبَارِهَا وَاَشْعَارِهَا اَثَاثًا وَّمَتَاعًا اِلَى حِيْنٍ (سورة النحل)

*'එයින් බැටළුවන්ගේ ලෝමයෙන්ද, තවද ඔටුවන්ගේ ලෝමයෙන්ද, සුදු එළුවන්ගේ ලෝමයෙන්ද, ඔබලාට ඔහු වස්ත්‍රයන් හා නියමිත කාලයක් දක්වා සුව පහසුවද දී ඇත්තේය.'*

*අන්නහ්ල් 80*

### <u>නජිස්වල වර්ගයන් වන අයිනියියා සහ හුක්මියා (النجاسة العينية والنجاسة الحكمية)</u>

<u>අයිනියියා අපවිත්‍රය</u>

මෙය පියවි ඇසට දෘශ්‍යමාන වන නජිස් වර්ගය වේ. එසේත් නැත්නම් එහි ගන්දයක් හෝ පැහැයක් හෝ ඇති නජිස් වර්ගය වේ. මෙයට උදහරණයක් ලෙස මළ මූත්‍ර හෝ රුධිරය දැක්විය හැක.

<u>හුක්මියා අපවිත්‍ර වර්ගය</u>

මෙය පියවි ඇසට නොපෙනෙන නජිස් වර්ගය වේ. එනම් වියලුනු, ගන්දයද, පැහැයද, නොමැති වර්ගය වේ. උදහරණයක් ලෙස මූත්‍ර අප වස්ත්‍රයක වැදී වියලී නොපෙනී දුගඳද නොදැනෙන තත්වය කිව හැක.

**නජිස් වර්ගයන්**

<u>1. **කඨින නජිස්** (اَلْمُغَلَّظَة)</u>

මෙය බල්ලන් සහ ඌරන් සම්බන්ධ නජිස් වේ. මෙම සතුන් ස්පර්ශ වීමෙන් හට ගන්නා අපවිත්‍ර තාවය වරක් ජලයෙන් හා සේදීමෙන් ඉවත් නොවේ. මෙය සත් වරක් ජලයෙන් සේදීමෙන් පමණක් ඉවත් වේ. තවද ඉන් එක් වරක් වැලි මිශ්‍ර කර සේදිය යුතුය. මේ සඳහා වන හදීස් ප්‍රකාශයන් මීට ඉහත සඳහන් කරන ලදී. එහිදී බල්ලන් පමණක් සඳහන් වුවද ඌරන් ඉතාම පහත් සතෙකු හෙයින් ඌද 'කියාස්' රීතිය මගින් මෙම කොටසට ඇතුලත් කරන ලදී.

<u>2. **මෘදු නජිස්** (اَلْمُخَفَّفَة)</u>

මෙය පිරිමි බිළිඳෙකුගේ මූත්‍රා වේ. නමුත් එම දරුවා මව් කිරි හැර අන් කිසිවක් ආහාරයට නොගන්නා වූද,

වසර දෙක නොඉක්මවූවෙකුද විය යුතුය. මෙම නජීසය මත ජලය මඳක් ඉසීමෙන් එහි අපවිත්‍ර බවෙන් මිදිය හැක. නමුත් එසේ ඉසින ලද ජලය එම නජීසය තැවරුනු සෑම තැනටම වැදිය යුතුය. ජලය ඒ මත වත් කිරීම අවශ්‍ය නොවේ.

**عن ام قيس بنت محصن رضى الله عنها أنها اتت بابن لها صغير لم يأكل الطعام إلى رسول الله صلى الله عليه وسلم فبال على ثوبه فدعا بماء فنضحه ولم يغسله (رواه البخاري ٢٠٢١ )**

***උම්මු කයිස් රලියල්ලාහු අන්හු තුමිය දන්වන එක් හදීසයක මෙසේ සඳහන් වේ. කෙනෙකු කිරි පමණක් ආහාරයට ගන්නා බිළිඳෙකු නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමානන් වෙත රැගෙන පැමිණියේය. එම බිළිඳ නබිතුමන් වස්ත්‍රයේ මූත්‍රා කළේය. එවිට නබිතුමන් ජලය ගෙන්වා එය මත ඉසූහ. එය නොසේදූහ.***

3. සාමාන්‍ය නජීස් (المتوسطة)

මෙය බල්ලන් හා ඌරන් නොවන නජීස් වර්ගයන් වේ. තවද කිරි පමණක් ආහාරයට නොගෙන අනෙකුත් වර්ගයන් ආහාරයට ගන්නා බිලිඳුන්ගේ මූත්‍රාද මෙම වර්ගයට අයත් වේ. මෙයට තවත් නිදසුන් ලෙස මිනිසුන්ගේ මූත්‍රා සතුන්ගේ බෙටි, රුධිරය ආදිය දැක්විය හැක. මෙවැනි නජීස් වර්ගයන් ජලය ඒ මත ඉසීමෙන් පමණක් ඉවත් නොවේ. එසේම සත් වරක් සේදීමද අවශ්‍ය නොවේ. වරක් සේදීමෙන් එය ඉවත් වුවහොත් නැවත සේදීම අවශ්‍ය නොවේ.

عن انس قال : كان النبي صلى الله عليه وسلم إذا تبرز لحاجته اتيته بماء فيغسل به (رواه البخاري ٢١٤ )

*අනස් රලියල්ලාහු අන්හු මගින් හදීස් දැන්වීමක මෙලෙස වේ. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමන් සිය ශාරීරික අවශ්‍යතාවයක් ඉටු කිරීමට (එනම් වැසිකිළි අවශ්‍යතාවයන්) යන කල මම එතුමන්ට ජලය ගෙන දුන්නනෙමි. එයින් එතුමන් පිරිසිදු කර ගත්හ.*

*බුහාරි 214*

عن علي قال : كنت رجلا مذاء فستحييث ان أسئل رسول الله صلى الله عليه وسلم فأمرت المقداد بن الأسود فسأله فقال فيه الوضوء

ومسلم : يغسل ذكره ويتوضأ (رواه البخاري : ١٧٤ وسلم :٣٠٣ )

*අලි රලියල්ලාහු අන්හු මෙසේ පවසති 'මා අධික ලෙස 'මදී'1 පිටවන කෙනෙකුව සිටියෙමි. නමුත් මේ පිළබඳ නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමන්ට පැවසීමට ලැජ්ජා වුයෙමි. එනිසා මම මික්දද් බින් අස්වද රලියල්ලාහු අන්හු මගින් මේ පිලිබඳ විමසුවෙමි. එවිට නබි තුමන් වුළු අධී දේවනය කර ගත යුතු යයි පැවසූ බවද, තවත් දැන්වීමක සිය පුරුෂ අවයව සෝදා ගත යුතුය යනුවෙන් සඳහන් බවද ප්‍රකාශිතයි.*

عن عبد الله بن مسعود قال : أن النبي صلى الله عليه وسلم الغائط فأمرني أن اتيه بثلاثة أحجار فوجدت حجرين والتمست الثالث فلم اجده

فأخذت روثة فأتيته بها فأخذ الحجرين وألقى الروثة وقال هذا ركس ( رواه البخاري : ١٥٥ )

*අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් මෙසේ දන්වා සිටියි. 'නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමන් මළ පහ කිරීම සඳහා ගියහ. එවිට ගල් කැට තුනක් ගෙනෙන මෙන් පැවසූහ. මට ගල් කැට දෙකක් පමණක් ලැබුනි. එනිසා වියලි බෙටි ස්වල්පයක් තෙවැනි ගල වෙනුවට මම දුන්නෙමි. නමුත් නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමන් ගල් දෙක පමණක් ගෙන , බෙටි ඉවත දමා එය නජීස් වේ යයි පැවසූහ.'*

ඉහත හදීස් වාර්තාවන් මගින් පෙරකී දේ නජීස් නම් අපවිත්‍ර බව සනාථ වේ.

1.**'මදී'** රහස් ප්‍රදේශයෙන් කාමාශාවන් ඇති වූ හෝ එය ඇති වී පරිපූර්ණ කර ගැනීමේ හැකියාව නොමැති විට පිට වන්නාවූ ඇලෙන සුළු කහ ද්‍රවය වේ.

2.**'වදී'** යනු මූත්‍රා කිරීමෙන් පසු පිටවන්නා වූ සුදු පැහැති ද්‍රවයකි. තවද බර ඔසවන විට පිටවන්නේද මෙය වේ. මෙම දෙවර්ගයම නජීස් වේ.

---

**නජීස් වෙතින් පිරිසිදු වන්නේ කෙසේද?**

1. කඨින නජීසයන්ගෙන් පිරිසිදු වන ක්‍රමය

පෙරකී පරිදි මෙම නජීසයන් වනාහි බල්ලන් ඌරන් සම්බන්ධ අපවිත්‍රයන් වන අතර,ඒ සත් වරක් ජලයෙන් සේදීම හා ඉන් එක් වරක් වැලිද මිශ්‍ර කර සේදීම කළ යුතුයි. මෙය පියවි ඇසට පෙනුනද නොපෙනුනද, එහි ගඳ දැනුනද නොදැනුනද, මෙසේ සේදීම කළ යුතුමය. මෙම නජීසය වස්ත්‍රයෙහි හෝ සිරුරෙහි හෝ යම් තැනෙක හෝ වැදුනද මෙම රීතීන් එක ලෙසින්ම බලපානු ඇත.

2. සාමාන්‍ය නජීස් වර්ගීයන්ගෙන් පිරිසිදු වීම

පෙර සඳහන් ඌරන් හා බල්ලන් සම්බන්ධ නොවූද, කිරි පමණක් බොන බිළිඳෙකුගේ මූත්‍රාද නොවන නජීස් වර්ගීයන් වේ. මෙයින් පිරිසිදු වීම සඳහා ඒ මත ජලය වත් කර එහි දුගඳ , පැහැය, යනාදිය සම්පූර්ණයෙන්ම ඉවත් කළ යුතුය. මෙයද වශ්ත්‍රයේ හෝ සිරුරේ යම් තැනෙක තිබුනද මෙලෙසින් සෝද පිරිසිදු කර ගත යුතුය. එසේ වුවද එහි පැහැය සම්පූර්ණයෙන්ම ඉවත් කර ගැනීම අසීරු අවශ්ථාවක, ඒ සඳහා අධික වෙහෙසක් නොදැරීමට අනුමැතිය ඇත. රුධිරයේ පැහැය වශ්ත්‍රයකින් ඉවත් කිරීමට අපහසු අවශ්ථාව මෙහිදී සඳහන් කළ හැක.

3. මෘදු නජීස් වර්ගීයන්ගෙන් පිරිසිදු වීම

මෙය කිරි පමණක් ආහාරයට ගන්නා, වසර දෙක නොඉක්මවූ පිරිමි බිළිඳෙකුගේ මූත්‍රා වේ. මේ මත පූර්ණ ලෙස ජලය ඉසීමෙන් පිරිසිදු විය හැක. එය පෙනෙන හෝ නොපෙනෙන නජීසයක් වුවද, එය තැවරුණු වශ්ත්‍රයේ හෝ සිරුරේ හෝ යම් තැනක වුවද මෙම රීතීන් එක ලෙසින්ම බලපානු ඇත.

**බල්ලන්, ඌරන් නොවන සතුන්ගේ සම පිරිසිදු කිරීම**

ඌරන් හා බල්ලන්ගේ සම කිසිසේත් පිරිසිදු කළ නොහැකි හෙයින් ඒවා භාවිතා කිරීම තහනම් වේ. ඒ හැර අන් සතුන්ගේ සම තෙම්පරාදු කිරීමෙන් පිරිසිදු කළ යුතුය. තෙම්පරාදුව යනු සමෙහි ඇති ලේ, කෙස් වැනි නරක් විය හැකි දේ ඉතා තිත්ත යම් දෙයකින් පිරිසිදු කිරීම වේ. කොතෙක් දුරටද යත් එම සම ජලයේ තබා ගත් පසු, නැවත දුගඳ හැමිය නොයුතුය.

**قال رسول الله صلى الله عليه وسلم اذا دبغ الا هاب فقد طهر (رواه مسلم ٣٤٤ )**

***'තෙම්පරාදු කිරීමෙන් සම පිරිසිදු වේ' යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමන් පැවසූහ.***

තෙම්පරාදු කරන ලද සම ජලයෙන් පලමුව පිරිසිදු කර ගැනීම වාජිබ් වේ. ඇයිද යත් තෙම්පරාදු කිරීමට පෙර තිබුනු අපවිත්‍ර දේවලින් පිරිසිදු විය යුතු හෙයිනි.

සමාව දිය හැකි සමහර නජීස් වර්ගීයන් (المعفوات)

ඉස්ලාම් ධර්මය පිරිසිදු බව පෙරදැරි කොට ගත් ජීවන මගකි. අපවිත්‍ර වස්තූන් පිලිබඳ හා ඒවායින් ඉවත් වීම පිලිබඳ මෙතරම් සැලකිලිමත් වන්නෙමේ නිසාමය. නජීස්වලින් පිරිසිදු වීම වන්දනයක් පිලිගැනීම සඳහා වන ප්‍රධාන කොන්දේසියක් ලෙස ඉස්ලාම් ධර්මය නිර්දේශ කරන්නේද එනිසාය. එය වශ්ත්‍රයේ, සිරුරේ හෝ වැඳුම් ස්ථානයේ තිබුනද එයින් පිරිසිදු විය යුතුමය.

එසේම ඉස්ලාම් ධර්මය කිසිවෙකු අපහසු තාවයට පත් කිරීමට අදහස් නොකරයි. එනිසාම සමහර නජීසයන් සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම අපහසු නිසාද, එයින් වැළකී සිටීම අපහසු නිසාද, ඒවා පිළිබඳ ලිහිල් වූ රීතියන් ඉදිරිපත් කරයි.

එවැනිවූ සමහර නජීසයන් පහත පැහැදිලි කර ඇත.

1. අප නොදැනුවත්ව අප සිරුරේ හෝ වශ්ත්‍රයේ වැදෙන මූත්‍රා වැනි නජීසයන්. මෙසේ අප නොදැනුවත්ව වැදෙන නජීස් වර්ගීය දරුණු වුවද මෘදු වුවද ඒ සඳහා සමාව ලැබෙනු ඇත.

2. තවද සුළු ප්‍රමාණයක් වූ රුධිරය, සැරව, මදුරුවන්ගේ රුධිරය, මැස්සන්ගේ අපවිත්‍රයන් යනාදියද වේ. නමුත් මෙය කෙනෙකු ඕනෑකමින් සිය සිරුරේ තවරා නොගත් ඒවා විය යුතුය.

3. තුවාල වලින් පිටවන සැරව, එය ප්‍රමාණයෙන් වැඩි වුවද එය පිටවන පුද්ගලයා හා එම තුවාලය අවට පමණක් තැවරුනහොත් එය සඳහා සමාව ඇත.

4. පැල සිටවන අවශ්ථාවලදී බීජවල වැදෙන සතුන්ගේ බෙටිද, කිරි දෙවන විට එතුල වැටෙන සුළු ප්‍රමාණයේ බෙටිද මෙම සමාවට ඇතුලත්ය. නමුත් කිරි හා මිශ්‍ර වන බෙටි ප්‍රමාණය කිරිවල සුදු පැහැය වෙනස් කරන තරම් වැඩි නම් එම කිරි නජීස් හා බීමට නුසුදුසුද වන බව සැලකිය යුතුය.

5. තවද ජලයේ මත්ශ්‍යයන් විසින් දමන ලද බෙටි නිසා එම ජලයේ පැහැය වෙනස් නොවුනි නම් එම ජලය භාවිතා කළ හැක. තවද පරෙවියන් වැනි පක්ෂීන් බහුලව ගැවසෙන ස්ථාන (උදා: මක්කා මදීනා නගරවල මස්ජිදයන් අසල සිටින පක්ෂින්) එම පක්ෂීන්ගේ බෙටිවලින් පිරී තිබුනද, එය වළකා ගැනීම අපහසු හෙයින් ඒ සඳහා සමාව ඇත.

6. අනුභවයට අනුමත මාංශවල තිබෙන රුධිරය.

7. වමනය කළ දරුවෙකුගේ මුඛය. එය සිය මවගේ තනපුඩුවෙහි තැබුවද, එයද සමාව දිය හැකි නජීසයක් වේ.

8. පාරෙහි ඇති දූවිලි යනාදිය.

9. ගලා යන රුධිර නොමැති මැස්සන්, කුහුඹුවන්, මදුරුවන් වැනි කෘමින් පැන් වර්ගයක වැටුනහොත් එම බීම අපිරිසිදු නොවේ. මෙහි කොන්දේසිය නම් එම කෘමියා නිතැතින්ම එහි වැටුනා විය යුතුය. නමුත් එයින් එම බීමේ පැහැය වෙනස් වුවහොත් එය නජීස් වූ බව සලකා ඉවත දැමිය යුතුය.

رواه البخاري وغيره عن أبي هريرة : أن رسول الله صلى الله عليه وسلم قال : إذا وقع الذباب في إناء أحدكم فليغمسه كلة
ثم يطرحه في أجد جناحيه شفاء وفي الأخرداء

***නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමන් මෙසේ පැවසූහ. 'ඔබගේ බීම භාජනයක් තුල මැස්සෙකු වැටුනහොත් උෘ සම්පූර්ණයෙන් එම බීමෙහි ඔබා විසි කර එය පානය කරන්න. මන්ද යත් මැස්සාගේ එක් තටුවක රෝගයද, අනෙක් තටුවෙහි ඒ සඳහා වන ඔසුවද ඇත්තේය. මැස්සන් අපවිත්‍ර නම්, එසේ එය බීමෙහි ගිල්වා පසුව එය පානය කිරීමට අනුමැතිය නොලැබෙනු ඇත. ඉහත නබි ප්‍රකාශය මත මැස්සන් වැනි කෘමින් සඳහා මෙම රීතිය අදාල වී ඇත.***

10. මස් වෙළෙන්දෙකුගේ සිරුරේ හෝ වශ්ත්‍රයේ තැවරෙන සුළු ප්‍රමාණයක් වන එම සතුන්ගේ රුධිරය.